# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/61 - 2014 මැයි මස 30 වැනි සිකුරාදා - 2014.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : දෙහි/2-1/අත්/743/(ඒ)(2).

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1813/18 හා 2013.06.06 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පලකරන ලද බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 537 ඒ දරන දුටුගැමුණු ග්‍රාම නිලධාරී වසමේ, දුටුගැමුණු ගමේ කැඩැස්තර සිතියම් අංක 520802 හා 2013.02.26 දිනැති අංක 02 කැඩැස්තර සිතියමේ ලොට් අංක 232 හි සංශෝධනය මෙසේය.

**01. කැබලි අංක 232**

ඉඩමේ නම: වරල්ලගහවත්ත හා කිරිපෙල්ලගමවත්ත, දුටුගැමුණු විදිය, වරිපනම් අංක 181ඒ; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ල; හිමිකම් කියන අය: රුක්මණී සියාමනී ද අල්විස්, අංක 181/ඒ, දුටුගැමුණු විදිය, කොහුවල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0144.

කේ. චම්පා එන්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිවල,

2014 මැයි මස 28 වැනි දින,
දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 453/1

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : දෙහි/2-1/අත්/743/(ඒ)(2).

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816/23 හා 2013.06.26 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පලකරන ලද බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දුටුගැමුණු ගමේ 2013.03.20 දිනැති හා මූලික පිඹුරු අංක කො. 9287 හි ලොට් අංක 03 හි සංශෝධනය මෙසේය.

**01. කැබලි අංක 03**

ඉඩමේ නම: වරිපනම් අංක 12, දුටුගැමුණු විදිය; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජී. වර්ෂවිතාන, අංක 12, දුටුගැමුණු විදිය, කොහුවල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0049.

කේ. චම්පා එන්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිවල,

2014 මැයි මස 28 වැනි දින,
දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 453/2

1A - G 019641 - 130 - (2014/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : තිප්‍රාලේ/1/18/3/41අත්.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/10/2012/LRB/277.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :*

**ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පොදු කාර්යයන්ට යොදා ගැනීම සඳහා නාරාහේන්පිට ඇලදුව කැබලි අංක 1, 2 හා 3 ඉඩම් අත්පත් කර ගැනීම.**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, (කොට්ඨාස අංක 41, කිරුළ, කොළඹ මහ නගර සභා සීමාව තුළ) නාරාහේන්පිට ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කො. 9437 හා 2014/05/02 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.1937 ක් පමණ වූ ඉඩම් කැබැල්ලේ විස්තර පහත පරිදි වේ.

**කැබලි අංක 01**

ඉඩමේ නම: ඇලදුව; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; මුල් හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1937.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 ජූලි මස 10 වැනි දින පෙ.ව. 10.00 ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2014 ජූලි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ගීතාමනී සී. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය කොට්ඨාසය.

2014 මැයි මස 28 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 454

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ප්‍රාලේබ/ඉ/1/2/8.

අංක 1103/13 හා 1999.10.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ දැන්වීම අංක 1509/6 හා 2007.08.07 දිනැති *ගැසට් පත්‍රය* මගින් සංශෝධනය කර ප්‍රසිද්ධ කරන ලදී. ඉහත *ගැසට්* පත්‍ර දෙකෙහිම සඳහන් 7 වගන්තියේ දැන්වීම් දෙකට අදාළ විස්තර පහත පරිදි සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරමි.

අංක 1103/13 හා 1999.10.27 දිනැති *ගැසට්* නිවේදනය තුළ පළ කරන ලද 7 වන වගන්තියේ දැන්වීමෙහි සඳහන් මු.පි.ර/188 හි කැබලි අංක 01 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6439 දරන වැවේකුඹුරහේන *හෙවත්* වැවේවත්ත ඉඩම නැවත මැන සංශෝධිත පිඹුරක් සකස් කර නව කැබලි අංක යොදන ලද අතර එසේ සකස්කළ පිඹුරේ කැබලි අංක 02 සහ 04 අත්පත් කර ගන්නා ඉඩම් වශයෙන් නිරූපනය කර ඇත. සංශෝධිත මු.පි.ර/188 හි කැබලි අංක 02 හි ප්‍රමාණය හෙක්ටයාර් 0.0215ක් ද කැබලි අංක 04 හි ප්‍රමාණය හෙක්ටයාර් 0.0040ක් වන බව දැනුම් දෙමි.

එමෙන්ම අංක 1103/13 හා 1999.10.27 දිනැති *ගැසට්* නිවේදනය තුළ පළ කරන ලද 7 වන වගන්තියේ දැන්වීමෙහි සඳහන් අ.ග.පි. 298 අතිරේක 26 පිඹුරේ කැබලි අංක 502 දරණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4198 වූ වැවේකුඹුරහේන *හෙවත්* වැවේවත්ත ඉඩම නැවත මැන සංශෝධන පිඹුරක් සකස් කර නව කැබලි අංක යොදා ඇත. එයින් කැබලි අංක 592 අත්පත් කර ගන්නා ඉඩම වශයෙන් නිරූපනය කර ඇත. සංශෝධිත අ.ග.පි. 298 අතිරේක 26 පිඹුරේ කැබලි අංක 592 හි ප්‍රමාණය හෙක්ටයාර් 0.2089 ක් වන බව දැනුම් දෙමි.

චම්පික නිරෝෂ් ධර්මපාල,
ප්‍රාදේශීය ලේකම්,
බලංගොඩ.

2014 මැයි මස 28 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 455

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.